# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 09/2014

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2014.09. 22

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>වැටුප් පරිමාණයේ උපරිමයේ රැඳී සිටීම මත වැටුප් වර්ධක ගෙවීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2009.03.12 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 909 මගින් සංශෝධිත 2007.09.05 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 894 හා 2013.12.31 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 20/2013 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

වැටුප් පරිමාණයේ උපරිම වැටුප් තලයේ රැඳී සිටීම මත වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල මගින් ඉල්ලා තිබූ පැහැදිලි කිරීම් හා ඒ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ ඩීඑම්එස්/ඊ1/54/7/313/2 අංක දරන ලිපියෙන් ලබා දී ඇති උපදෙස් අනුව දැනට ක්‍රියාත්මක විධිවිධාන සලකා බැලූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2014.08.07 වැනි දින පැවති සිය 899 වැනි සභා වාරයේ දී, වැටුප් පරිමාණයේ උපරිමයේ රැඳී සිටීම මත වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් පහත ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමට තීරණය කරන ලදි ;

1. තම වැටුප් පරිමාණයේ උපරිම වැටුප් පියවරට පැමිණි සේවකභවතුන්ට, 2014.01.01 දින සිට එකී උපරිම වැටුප් තලයේ ම රැඳී සිටීමෙන් තොරව අදාල වැටුප් පරිමාණයේ අවසන් වැටුප් වර්ධක අගයට සමාන අගයකින් සිය වාර්ෂික වැටුප් වර්ධකය උපයා ගැනීමට ඉඩ දිය යුතු වේ.

2. මෙහි දී, 2014.01.01 ට පෙර සිට ම වැටුප් පරිමාණයේ උපරිමයේ හෝ උපරිමය ඉක්මවූ යම් වැටුප් පියවරක රැඳී සිටින සේවකභවතුන් සම්බන්ධයෙන් එකී කාලය ඇතුළත උපරිමයේ රැඳී සිටි සෑම අවුරුද්දකට ම නියමිත වැටුප් වර්ධකය ලබා දෙමින් 2014 වර්ෂයේ වැටුප් වර්ධකය යෙදෙන දින දක්වා අදාල වැටුප් පියවර ගැලපීමට ද එහි දී 2014.01.01 දිනට ප්‍රථමයෙන් වූ කාල පරිච්ඡේදය සඳහා හිඟ වැටුප් ගෙවීමකින් තොරව මෙය සිදු කිරීමට ද පියවර ගත යුතු ය.

3. උපරිමයේ රැඳී සිටීම මත වැටුප් වර්ධක ප්‍රදානය කිරීමේ දී ද වාර්ෂික වැටුප් වර්ධකය ලබා දීමේ දී අනුගමනය කරනු ලබන කාර්ය සාධනය හා පැමිණීම පදනම් කරගත් ක්‍රියා පිළිවෙත ම අනුගමනය කිරීම මැනවි.

මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වීමත් සමග 2007.09.05 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 894, 2009.03.12 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 909 හා 2013.12.31 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 20/2013 හි සඳහන් විධිවිධාන අවලංගු වේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ, මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත් :
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරි
9. මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතනවල පුස්තකාලයාධිපති/ ජ්‍යෙ.ස.පුස්තකාලයාධිපතිවරුන්/ ස. පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන/ මණ්ඩපවල ජ්‍යෙ.ස.ලේඛකාධිකාරීවරුන්/ ස.ලේඛකාධිකාරීවරුන්
12. උසස් අධ්‍යාපන ආයතන/ මණ්ඩපවල ජ්‍යෙ.ස.මූල්‍යාධිකාරීවරුන්/ ස.මූල්‍යාධිකාරීවරුන්
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණන අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙ.ස.අභ්‍ය.විගණකවරුන්/ ස.අභ්‍ය.විගණකවරුන්
16. සියලුම වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති.

ගොනු අංකය : යූජීසී/එච්ආර්/2/9/86

T/-